# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 78 — 1973 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා — 1973.09.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පලකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1265 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 1280 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1278 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1280 |
| තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැළකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත 1973 සැප්තැම්බර් 21 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ. (ii) ජාතික ලේඛනාරක්ෂක පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් වැඩ සඳහා 1973. 10. 08 දින දහවල් 12 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් කොළඹ—9 බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

1\. වැලිකඩ බන්ධනාගාරයේ ගැ. 20,000 ක ජලය රැස්කර තැබිය හැකි ජලස්තම්භයක් ඉදිකිරීම (උස අඩි 60 අඟල් 00)

2\. බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර මූලස්ථාන අධිකාරී වෙතින් 1973. 10. 04 දින පස්වරු 12 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්වල, පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු අතර අදාල සියලුම විස්තරද ඔහුගෙන් ලබාගත හැක. ජල සම්පාදන දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල රු. 3,00,000කට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ට රු. 150 බැගින්වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් වෙනුවෙන් කච්චේරි කුවිතාන්සියක් හෝ බන්ධනාගාර මූලස්ථානයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් හා රු. 3,00,000කට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ලියාපදිංචිවී ඇති බවට අවශ්‍ය විස්තර ඉදිරිපත් කළ පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. තැපැල් ඇණවුම්, මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. ටෙන්ඩර්පත් ගාස්තු වශයෙන් රු. 25 ක මුදලක් අයකරනු ලැබේ. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

3\. ටෙන්ඩර් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වැලිකඩ බන්ධනාගාරයේ ජලස්තම්භය සඳහා ටෙන්ඩර් පත්‍රය" යි සඳහන් කළ යුතුය. සියලුම ටෙන්ඩර්පත්‍ර සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්පත් ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම් බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර මූලස්ථාන අධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බහාලන පෙට්ටියේ පැමිණ බහාලිය යුතුය.

4\. 73.10.08 දින ප. ව. 1.30 ට ඉහතකී බන්ධනාගාර මූලස්ථාන අධිකාරි කාමරයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අතර එම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර් කරුවන් හෝ ඔහුගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

5\. කිසිදු හේතුවක් නොදක්වා සියළුම ටෙන්ඩර්පත් ප්‍රතික්ෂෙප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම ටෙන්ඩර් මණ්ඩලය සතුය.

6\. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් 5% ක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිළිගත් බව දැනුම්දීමෙන් පසු දින 7ක් ඇතුලතදී වැඩ ගිවිසුමකට අත්සන් කළ යුතුය. ටෙන්ඩර් භාරගත්

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

ලියවිල් ඔහුට පුද්ගලිකව භාරදීමෙන් හෝ ඔහු දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍රයට අත්සන් කිරීඹ අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවා ඇත. අසාර්ථක ටෙන්ඩර්කරුවකුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් 5%ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ පසුවයි.

7. මෙම කොන්ත්‍රාත්තුව කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යොදවා ගැනීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුය. එවැනි කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශය තුළිනි. කම්කරුවන්ට වේතනය ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වින හා මින් ඉදිරියට ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල ගෙවීම කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුය.

8. වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථාන අධිකාරීගෙන් ලබාගත හැකිය.

ඒ. ඒ. ද සිල්වා.
වැ. බ. බන්ධනාගාර කොමසාරිස්

1973 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දීය.

9-481—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය**
**ටෙන්ඩර් දැන්වීම් අංක : 9/73**
**කාර්යාල උපකරණ සේවා කිරීම**

1973. 10. 01 සිට 1974. 12. 31 දක්වා කාලය තුල යතුරු ලියන, ගණක යන්ත්‍ර සහ එකතුකිරීමේ යන්ත්‍ර සේවා කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1973. 09. 28 දින ප. ව. 2.30 දක්වා වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ ඉංජිනේරු කළමනාකරු විසින් භාර ගනු ලැබේ.

වැඩි විස්තර හා අදාල ටෙන්ඩර් පෝර්ම පාලක ලේකම්, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, කොළඹ—1 හෝ මිළයට ගැනීමේ නිලධාරි, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය, ඉංජිනේරු කොට්ඨාශය, කොළඹ—13, වෙතින් ලබාගත හැක.

ඉංජිනේරු කළමනාකරු.

9-562—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**ලංකා ගමනාගමන මණ්ඩලය**

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 1973 ඔක්තෝබර් මස 18 වෙනි දින පෙ. ව. 10.00 වනතෙක් සිල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත්කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව |
|---|---|
| 1. මාතර ඩිපෝවේ ගොඩනැගිලි, පාරවල් සහ අංගනය තැනීම—ඉසි/502 ... | රු. 225,000.00 |
| 2. අළුත්ගම ඩිපෝවේ ගොඩනැගිලි, පාරවල් හා අංගනය තැනීම—ඉසි/555 ... | රු. 50,000.00 |
| 3. හාරගම ඩිපෝවේ භූමිය පස් කපා සමතලා කිරීම—ඉසි/559 ... | රු. 200,000.00 |
| 4. මැදවච්චිය භූමිය පස් කපා සමතලා කිරීම ඉසි/547 ... ... | රු. 50,000.00 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබා ගත් ආකෘති පත්‍රවල, පිළියෙලකොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාළ සැලසුම් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. ලංගම රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක 1 සහ 3 සඳහා එකකට රු. 200 බැගින්ද, 2 සහ 4 සඳහා රු. 100 බැගින්ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් වැඩ අංක 1 සහ 2 සඳහා රු. 40 බැගින්ද, 2 සහ 4 සඳහා රු. 25 බැගින්ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 ඔක්තෝබර් මස 17 වෙනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර් කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

9-557—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**
**1973/1974 වර්ෂය සඳහා ප්‍රවාහණ රථ සැපයීමේ ටෙන්ඩර්පත්**

1973/1974 වර්ෂය තුල අභ්‍යන්තර ප්‍රවාහණ සේවා සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. යථෝක්ත පිරිසෙයින් ලොරි 10 ක් වත් හිමි අය පමණක් ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

තමන් සතු රථ වෙනුවෙන් මෙම වර්ෂය සඳහා බලංගු ලියාපදිංචි කිරීමේ සහතික සහ ආදායම් බලපත්‍ර සමග කුලියට ගැනීමට බලාපොරොත්තු වන අතිරේක රථ 15 හිමියන්ගේ නම් හා ලිපිනයන් හා එම රථ සම්බන්ධ විස්තර ඉදිරිපත් කොට, ආපසු ලබාගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවාලීමෙන් ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සහ ලැයිස්තු පහත සඳහන් අයගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

1973 සැප්තැම්බර් 28 වෙනි දින පෙ. ව. 10.00 තෙක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

9-559—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම**

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 ඔක්තෝබර් මස 12 වන දින පස්වරු 2.00 වනතෙක් භාරගනු ලැබේ.

බතලගොඩ ගොවිපලේ ලෙලි පොල් 40,000 ක් පමණ හා
වාරියපොල ගොවිපලේ ලෙලි පොල් 30,000 ක් පමණ

(i) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුළතදී ගොවිපලේ කළමනාකරුට සම්පූර්ණ පොල් තොගය සඳහා මුළු මුදල එකවර ගෙවා පොල් තොගය භාරගෙන ගොවිපලින් බැහැර කරගත යුතුය. මොනම හේතුවක් නිසාවත් පොල් තොග මිළදී ගැනීම සඳහා දෙනු ලබන කාලය නැවත දීර්ඝ කරනු නොලැබේ.

(ii) පොල් තොගය භාර ගැනීමේදී කිසිම පිළිවෙලකට වර්ග කිරීමකට ඉඩ නැත. එමෙන්ම පුහුවූ හෝ කුණුවූ හෝ, කුඩාවූ හෝ වශයෙන් වර්ග කිරීමටද ඉඩ නැත.

2. පේරාදෙණියේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) කාර්යාලයෙන් ලබාගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි බතලගොඩ/වාරියපොල රජයේ ගොවිපලේ ලෙලි පොල් මිළයට ගැනීම කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම

සැ.යු.—කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, වවුනියාව සහ රත්නපුරය යන පළාත්වලපිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර .—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ අවසාන දිනට සැලකියයුතු කාලයකට ප්‍රථම තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවැනි ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි තැන, පුත්තලම '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයේ බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශිය ලේකම්තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවා යේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. ටෙන්ඩරයෙහි තීරණ.—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම් කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාලසීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩුබාහිරාදිය තබාගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (I) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3¼ ක් ඇතුළත්වන සේ බත් වේල සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(II) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීමට අනවශ්‍ය වනු ඇත.

(III) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිලට මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ. යම්කිසි අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(IV) කූපන් භාර නොදුනහොත් සේවකයින්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් ... ට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩු කරනු ලැබේ.

එම්. පී. ඒ. බලසේකර,
සෞඛ්‍ය සේවා අධිකාරි, පුත්තලම.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
පුත්තලම, 1973.09.07.

### උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | මස් | කරවල | එළවළු | බිත්තර | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — නොගෙවන රෝගීන්ට: මාළු | මස් | කරවල | එළවළු | බිත්තර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | | | |
| කල්පිටිය ප. ඒ. ... | 100... | 800 | 1973.10.16 පෙ.ව. 10ට | 300... | 300... | 200... | 700... | 300 | 1,000... | 1,000... | 700... | 200... | 700 |
| කොට්ටුකච්චිය ග්‍රා.රෝ. | 100... | 800 | | 200... | 200... | 200... | 800... | 200 | 1,000... | 800... | 800... | 200... | 700 |
| නවගත්තේගම ග්‍රා.රෝ. | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 200 | 1,300... | 1,200... | 1,200... | 2,400... | 700 |
| උඩප්පුව ග්‍රා. රෝ. ... | 100... | 600 | | 300... | ... | 200... | 1,000... | 200 | 1,000... | — ... | 800... | 2,000... | 8000 |
| මාම්පුරි මා.නි. ... | 100... | 600 | | 150... | 150... | 100... | 800... | 100 | 400... | 400... | 400... | 900... | 300 |
| මහකුඹුකඩවල මා.නි. ... | 100... | 300 | | 50... | 50... | 50... | 800... | 150 | 10... | 10... | 10... | 20... | 10 |
| ආනමඩුව දි. රෝ. ... | 100... | 800 | | 450... | 450... | 450... | 1,350... | 450 | 2,500... | 2,500... | 2,500... | 7,500... | 2,500 |
| ගල්මුරුව ප. ඒ. ... | 100... | 800 | | 200... | 200... | 200... | 600... | 200 | 800... | 800... | 800... | 2,400... | 800 |
| දන්කොටුව ප. ඒ. ... | 100... | 800 | | 300... | 300... | 300... | 900... | 300 | 2,100... | 2,000... | 2,000... | 6,000... | 2,000 |
| මාදම්පේ ප. ඒ. ... | 100... | 800 | | 200... | 200... | 200... | 600... | 200 | 750... | 750... | 750... | 2,250... | 750 |
| මුන්දලම ප. ඒ. ... | 100... | 800 | | 250... | 250... | 250... | 750... | 250 | 1,100... | 1,100... | 1,100... | 3,300... | 1,100 |

9–524—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වෙනිද සිට 1974 දෙසැම්බර් 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බව සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල් වෙලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට ද හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡේදයේ (ii) වන කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වූවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වෙන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල" කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවා මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6 **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වැනි තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයෙහි දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතීනම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11 **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයුමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිළට මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

යම්කිසි අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iii) කූපන් බාර නුදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවට නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගෙ වුවචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා ලද සහල් දනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි සහල්වලට කූපන් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරනු ලැබේ

එල්. එන්. ද එස්. ජයසූරිය,
සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

1973 සැතැම්බර් මස 5 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල රුපියල් | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: අලුත් මාලු | හරක්මස් | කරවල | එළවළු | බිත්තර | නොගෙවන රෝගීන්ට: අලුත් මාලු | හරක්මස් | කරවල | එළවළු | බිත්තර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අම්බලන්ගොඩ රෝහල ... | 100... | 400 | 1973 ඔක්තෝබර් මස 23 වෙනිදින පෙ.ව. 10 ට | 250... | 250... | 250... | 800... | 250... | 1,500... | 1,550... | 1,600... | 4,850... | 1,600 |
| 2. හිනිදුම ගෘහ රෝහල | 100... | 800 | | 400... | 400... | 400... | 1,300... | 450... | 1,800... | 1,750... | 1,750... | 5,450... | 1,800 |
| 3. බද්දේගම පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 200... | 200... | 200... | 550... | 150... | 1,300... | 1,050... | 1,100... | 3,250... | 1,100 |
| 4. බොරකන්ද පර්යන්ත ඒකකය ... | 100... | 600 | | 200... | 200.. | 200... | 650... | 150... | 1,600... | 1,600... | 1,550... | 5,250... | 1,200 |
| 5. හික්කඩුව පර්යන්ත ඒකකය ... | 100... | 600 | | 250... | 250... | 250... | 700... | 250... | 750... | 800... | 750... | 2,300... | 750 |
| 6. ඉමදූව පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 150... | 150... | 150... | 500... | 200... | 1,400... | 1,450... | 1,600... | 4,250... | 1,600 |
| 7. ඉඳුරුව පර්යන්ත ඒකකය ... | 100... | 600 | | 250... | 300... | 250... | 750... | 250... | 400... | 400... | 450... | 1,250... | 400 |
| 8. අහංගම ගැමි රෝහල | 100... | 400 | | 150... | 200... | 200... | 550... | 200... | 600... | 650... | 600... | 1,900... | 650 |
| 9. හබරාදූව ගැමි රෝහල | 100... | 600 | | 200... | 250... | 250... | 700... | 250... | 550... | 550... | 550... | 1,650... | 600 |
| 10. මාදම්පෙ ගැමි රෝහල | 100... | 300 | | 150... | 150... | 150... | 400... | 150... | 350... | 350... | 350... | 1,100... | 350 |
| 11. බටපොල ගැමි රෝහල | 100... | 600 | | 50... | 50... | 50... | 150... | 50... | 600... | 600... | 600... | 1,800... | 600 |
| 12. නාගොඩ ගැමි රෝහල | 100... | 300 | | 150... | 150... | 150... | 400... | 150... | 250... | 200... | 250... | 700... | 200 |
| 13. ඌරගස්මන්හන්දිය ගැමි රෝහල ... | 100... | 300 | | 50 ... | 50... | 50... | 150... | 50... | 950... | 950... | 1,000... | 2,900... | 1,000 |
| 14. අමුගොඩ මාතෘ නිවාසය සහ පිටිගල පිරිමි වාට්ටුව ... | 100... | 300 | | 100... | 100... | 100... | 250... | 100... | 700... | 700... | 700... | 2,150... | 750 |
| 15. නෙලුව මාතෘනිවාසය | 100... | 300 | | 100... | 100... | 100... | 350... | 100... | 400... | 400... | 400... | 1,150... | 400 |
| 16. අක්මීමන මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 250... | 100... | 250... | 250... | 250... | 800... | 250 |
| 17. හබුරුගළ මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | 150... | 150... | 400... | 150... | 50... | 50... | 50... | 150... | 50 |

9–473/1—73,09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1973 නොවැම්බර් මස 1 වෙනිද සිට 1974 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට සෞඛ්‍ය කාර්‍යාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—රුපියල් 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන වෙන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු සිරියිඳු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පය පහත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරී මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මවිසින් නියම කරන ලද ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්‍යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එල්. එන්. ද එස්. ජයසූරිය,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 සැප්තැම්බර් මස 5 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේදී ය.

### උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) මසකට ප්‍රමාණය (පයින්ට්) | (4) අවසාන දිනය |
|---|---|---|---|
| උණවටුනේ සෞඛ්‍ය කාර්‍යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | උණවටුන ... | 10,700 | 73.10.19 පෙ.ව. 10 ට |

9–473/2—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාලු කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1974 ජනවාරි 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනිදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවන වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන්ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරින්ගෙන්ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩරකරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇපය මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදි පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යෑමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙන යෑමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

එල්. එන්. ද එස්. ජයසූරිය,
සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

1973 සැප්තැම්බර් මස 5 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල රුපියල් | (4) මසකට සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | (6) ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| ගාල්ල රෝහල : | | | | | |
| 1 වෙනි කොටස—සිහිකිරීමේ වාට්ටු 2, ශල්‍යාගාරය, වාට්ටු අංක 24, 25, 28, 29, 30 ළදරු වාට්ටු සහ තිඹිරි ගෙය | 50 ... | 100 ... | දිනපතා ... | 14,800 | 1973.10.19 පෙරවරු 10 ට |
| 2 වෙනි කොටස—ඇක්ස්රේ සහ කායික වෛද්‍ය අංශයන්, ලේ බැංකුව, රෝග නිරෝධායන පරීක්ෂණාගාරය, රසායනාගාරය, මුළුතැන් ගෙය, පාලන අංශය, අනියම් ලෙඩුන්ගේ කාමරය, බාහිර රෝගීන්ගේ අංශය, දන්ත, ඇස්, කණ, නාසය, උගුර පිළිබඳ සහ වෙනත් චිකිත්සාගාර, රෝහල් හෙදි නිවාස, රෝහල් පොලිස් මුළුව, බෙහෙත් හල, වෙළුම් අංශය සහ ඕවර්සියර් තැනගේ කාමරය | 50 ... | 100 ... | 4 ... | 1,200 | |
| 3 වෙනි කොටස—වාට්ටු අංක 1, 6 සිට 9, 11, 12 සහ රෝගීන් වෙන් කර තබන වාට්ටු | 50 ... | 100 ... | 4 ... | 1,900 | |
| 4 වෙනි කොටස—වාට්ටු අංක 2 සිට 5 සහ 14 සිට 19 ... | 50 ... | 100 ... | 10 ... | 3,400 | |
| 5 වෙනි කොටස—වාට්ටු 27 සහ කලාපිටිය මාතෘ නිවාසය ... | 50 ... | 100... ... | 10 ... | 700 | |
| 6 වෙනි කොටස—වාට්ටු 26 (ක්ෂය රෝග වාට්ටුව), 21, 22, සිහි කිරීමේ වාට්ටු 1 සහ ඕ. පී. ඩබ්ලිව්. පිරිමි සහ ගැහැණු වාට්ටු | 50 ... | 100 ... | 4 ... | 1,100 | |

9-473/3—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

මගේ අංකය. එල්. එම්. 1505

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973.10.19 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ.පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| | වැඩෙහි ස්වභාවය | ප්‍රා.ආ.නි. කොටස | ලියාපදිංචි වියයුතු මුදල රු. | ශ. |
|---|---|---|---|---|
| 1 | දමුණුගස්තැන්න ජනපද පාර ... | තුම්පනේ ... | 50,000 | 0 |
| 2 | පින්නගොල්ල ,, ,, ... | පාතහේවාහැට... | 50,000 | 0 |
| 3 | මාපාකන්ද ජනපද පාර (2වැනි සැතපුම) | පස්බාගේ ... | 50,000 | 0 |
| 4 | නව අංගම්මන ජනපද පාර ... | උඩපළාත ... | 25,000 | 0 |
| 5 | වෙරළුගොල්ල ජනපද පාර ... | යටිනුවර ... | 35,000 | 0 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩිගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලට සහ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 73.10.12 වැනි දින දවල් 12තෙක් ටෙන්ඩර් පෝර්ම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයන් විසින් මහනුවර කච්චේරියේ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත්කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩරය බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාලු මුවදෙර මහා ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 73.10.19 වැනි දින පස්වරු 2.30ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එනම් 1973.10.19 වෙනි දින පස්වරු 2.30ට සියළුම ටෙන්ඩර්කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

7. සතුටුදයක ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලිය විල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් (5%) සියයට පහක් සතුටුදයක ලෙස නිම කිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදයක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදයක ටෙන්ඩර්කරුවන්හට මෙසේ දැනුම්දී දින 7ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රු. 100 රාජසන්තක කරනු ලැබේ.

ඩී. බී. ගුණරත්නායක,
මහනුවර දිසාපති වෙනුවට.

1973.09.08 වෙනි දින,
මහනුවර දිසාපති කාර්යාලයේ දී ය.

9–551—73.09.21 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

1974 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිර සැල්වල සිටින කරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසින ලද ආහාර සැපයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් 1974 ජනවාරි 1 සිට 1974 දෙසැම්බර් 31 වැනි දින දක්වා මුළු අවුරුදු කාලය තුළ පිසිනු ලබන ආහාර සැපයීම සඳහා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර්, ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි) භාරගනු ලැබේ. 73.10.9 වැනි දින පෙරවරු 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් 73.10.9 වැනි දින උදේ 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ඉලක්කමින් මෙන් ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේදී අසමානත්වයක් ඇති වී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත්තේය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් වේ :—

උදය ආහාරය—

(අ) ආප්ප හෝ ඉඳිආප්ප (අවුන්ස 6 කට නො අඩු විය යුතුයි) ;

(ආ) හකුරු අවුන්ස එකක් හෝ සම්බෝල ;

(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

දිවා හෝ රාත්‍රි භෝජනය—

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණයේ තැම්බූ බත් පිඟානක් ;

(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2 යි ;

(ඇ) එළවළු ව්‍යංජන දෙකයි. එක ව්‍යංජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ.යු.—(1) සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටසක් හෝ සැපයිය නොහැකි නම්, අධිකාරිතැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිළ ප්‍රමාණයට සෑහෙන සේ ආදේශක ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

(2) කොන්ත්‍රාත්කරුවන්ගෙන් උදය ආහාරය ලබා ගනු ලබන්නේ ආයතනය මගින් එය අඩු මිළකට සපයා ගැනීමට නොහැකි වුවහොත් පමණකි.

(3) පිළිගත් ටෙන්ඩර්කරුට සහල් ලබා ගැනීමට කූපන් හෝ බලපත්‍ර නිකුත් කරනු නොලැබේ.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරි තැන වෙත රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නො යවන ටෙන්ඩර් පත්‍ර එම අධිකාරි තැනට හෝ ඔහු විසින් පත් කරන ලද බලය ලත් නියෝජිතයෙකු වේ නම් ඔහුට හෝ භාරදී එය භාරගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " 1974 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසින ලද ආහාර සැපයීමේ ටෙන්ඩරය " යැයි ලියා වෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරි තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරිවරුන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාරගැනීම නතර කළ දින සිට සති 8 ක් යන තුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජනය කිරීමට ඉඩ තැබිය යුතුය.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරීන්ගේ කාර්යාලවලට හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නොහැකිවිනි නම් හෝ එසේ කිරීමෙන් වැළකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නො හැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට, එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අය කර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාර දුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලුම තැන්පත් මුදල්, කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේ දී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දැන ගැනීම සඳහා උපලේඛනයේ සඳහන් අධිකාරිවරුන්ගෙන් විමසනු මැනවි

12. ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ශ්‍රී ලංකා ජනරජය යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද ඔහුට පසු එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

සටහන —කලින් මෙම දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්වලට බැඳී නැති අය, පෝර්ම ඉල්ලීමේදී, තමන්ට එය ඉටු කිරීමට මුදල් තත්ත්වයක් ඇති බවට ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැන සහතික කළ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඒ. ද සිල්වා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1973 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹ, බන්ධනාගාර මූලස්ථානය.

## උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|---|
| 1. | අනුරාධපුරය බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | අනුරාධපුර වැඩබලන බන්ධනාගාර අධිකාරී |
| | පොළොන්නරුව සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | ත්‍රිකුණාමලය සිරසැල සහ උසාවිය | 25 | 100 | එම |
| 2. | මඩකලපුව බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | මඩකලපුව බන්ධනාරාග අධිකාරී |
| | කල්මුනේ සිරසැල සහ උසාවිය | 25 | 100 | එම |
| 3. | බදුල්ල බන්ධනාගාරය | 10 | 50 | බදුල්ල සහකාර බන්ධනාගාර අධිකාරී |
| | බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | මොණරාගල | 5 | 25 | එම |
| | නුවරඑළිය සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| 4. | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 25 | 150 | කොළඹ රිමාන්ඩ් අධිකාරී |
| | අළුත්කඩේ බන්ධනාගාරය සහ කොළඹ උසාවිය | 25 | 150 | එම |
| | හොරණ මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | කළුතර සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| | මැගසින් බන්ධනාගාරය | 25 | 100 | එම |
| | මතුගම මහේස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | පානදුර සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| | වැලිකඩ බන්ධනාගාරය | 25 | 150 | එම |
| 5. | බලපිටිය සිරසැල සහ උසාවිය | 10 | 50 | ගාල්ල බන්ධනාගාර අධිකාරී |
| | ගාල්ල බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | එම |
| 6. | චාවකච්චේරිය සිරසැල සහ උසාවිය | 5 | 25 | යාපනයේ බන්ධනාගාර අධිකාරී |
| | යාපනය බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | එම |
| | කයිට්ස් සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | මන්නාරම සිර සැල සහ උසාවිය | 5 | 25 | එම |
| | මල්ලකම් සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | මුලතිව් සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | පොයින්ට්පේද්‍රෘ සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | වවුනියා සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| 7. | ගම්පොල සිරසැල සහ උසාවිය | 5 | 25 | නුවර බන්ධනාගාර අධිකාරී |
| | හැටන් සිරසැල සහ උසාවිය | 25 | 150 | එම |
| | කෑගල්ල සිරසැල සහ උසාවිය | 25 | 100 | එම |
| | කුරුණෑගල සිරසැල සහ උසාවිය | 50 | 200 | එම |
| | නුවර බන්ධනාගාරය සහ උසාවිය | 50 | 200 | එම |
| | මාතලේ සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| | මාහෝ සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| | දඹුල්ල උසාවිය | 5 | 25 | එම |
| 8. | ගම්පහ සිරසැල සහ උසාවිය | 10 | 50 | මහර බන්ධනාගාර අධිකාරී |
| | කුලියාපිටිය සිරසැල සහ උසාවිය | 25 | 150 | එම |

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාර ගන්නා නිලධාරියා |
|---|---|---|---|
| 9. හම්බන්තොට සිරගෙය සහ උසාවිය ... ... ... | 5 ... | 25 ... | මාතර සහකාර බන්ධනාගාර අධිකාරි |
| මාතර බන්ධනාගාරය ... ... ... ... | 25 ... | 100 ... | එම |
| තංගල්ල බන්ධනාගාරය සහ උසාවිය ... ... ... | 10 ... | 50 ... | එම |
| තිස්ස සිරගෙය සහ උසාවිය ... ... ... | 5 ... | 25 ... | එම |
| වලස්මුල්ල සිරගෙය සහ උසාවිය ... ... ... | 5 ... | 25 ... | එම |
| 10. හලාවත සිරගෙය සහ උසාවිය ... ... ... | 10 ... | 50 ... | මීගමුව බන්ධනාගාර අධිකාරි |
| කතුවන මහෙස්ත්‍රාත් උසාවිය ... ... ... | 5 ... | 25 ... | එම |
| මාරවිල ... ... ... ... | 5 ... | 25 ... | එම |
| මීගමුව බන්ධනාගාරය සහ උසාවිය ... ... ... | 10 ... | 50 ... | එම |
| පුත්තලම සිරගෙය සහ උසාවිය ... ... ... | 10 ... | 50 ... | එම |
| 11. අවිස්සාවේල්ල සිරගෙය සහ උසාවිය ... ... ... | 25 ... | 100 ... | වැලිකඩ බන්ධනාගාර අධිකාරි |
| බලන්ගොඩ සිරගෙය සහ උසාවිය ... ... ... | 5 ... | 25 ... | එම |
| රත්නපුර සිරගෙය සහ උසාවිය ... ... ... | 25 ... | 100 ... | එම |
| රක්වාන සිරගෙය සහ උසාවිය ... ... ... | 5 ... | 25 ... | එම |
| දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවිය ... ... ... | 10 ... | 50 ... | එම |
| කලවාන මහෙස්ත්‍රාත් උසාවිය ... ... ... | 5 ... | 25 ... | එම |

9–525 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්. එස්. 157.

**වවුනියා කච්චේරිය**

වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා වෙන් වෙන්ව මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1973.10.15 වෙනි දින ප. ව. 2 දක්වා භාරගනු ලැබේ.

(1) ඇව සැපයීම හා ඇවවලින් කාමරයක් වෙන්කර සෑදීම— ව්‍යාපාර කාර්යාලය, ඔඩ්ඩුසුඩ්ඩාන්.

(2) ඔඩ්ඩුසුඩ්ඩාන් ව්‍යාපාර කාර්යාලයේ භූමිභාගයේ වැට වැඩි දියුණු කිරීම.

(3) මුතුඅයියන්කඩ්ඩු ව්‍යාපාරයේ ඉඩම් නිලධාරිගේ නිල නිවාසය වැඩිදියුණු කිරීම.

(4) මුතුඅයියන්කඩ්ඩු ව්‍යාපාරයේ ලිපිකරු නිල නිවාසය වැඩි දියුණු කිරීම.

2. සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තවිය යුතු අතර, ඒවා **වවුනියා කච්චේරියෙන් (ඉඩම් අංශයෙන්) ලබා ගන්නා ලද නියමිත** ෆෝර්මවල විය යුතුයි. මේ සම්බන්ධයෙන් වෙනත් සියළුම විස්තර වවුනියා කච්චේරියෙන් ලබා ගත හැක.

3. 1973.10.08 වෙනි දින ප. ව. 2 දක්වා මෙම දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

4. රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන් හා අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ගොවි කාරක සභා පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නන්ට ටෙන්ඩර් ෆෝර්ම සහ අනිකුත් ලියකියවිලි දෙනු ලබන්නේ ඔවුන් විසින් (එක් එක් වැඩය වෙනුවෙන්) වවුනියා කච්චේරියේ රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ඉහත කී අනුමත කරන ලද සමිති විසින් මෙම තැන්පත් මුදල ගෙවීම අවශ්‍ය නොවන්නේ ය.

ඒ. එම්. එම්. කුලනායගම්,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973.09.05 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී ය.

9–537—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අන්වීක්ෂක (මයික්‍රස් කෝප්) සැපයීමේ ටෙන්ඩරය

කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ඔක්තෝබර් මස 10 දින පෙරවරු 10 තෙක් පහත සඳහන් අන්වීක්ෂක (මයික්‍රස්කෝප්) ලඟ ඇති තොගයෙන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

රෝහල් රසායනාගාරයන්හි පාවිච්චිය සඳහා

අන්වීක්ෂක (මයික්‍රස් කෝප්) ... 02 යි

ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබාගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1973 ඔක්තෝබර් මස 9 දින තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මැන්දිස්,
**එයාර් කොමඩෝර්,**
ගුවන් හමුදාධිපති.

9–543—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

බදුල්ල බලවේග ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හෝමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.10.10 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 3,000කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 10. 09 දින මධ්‍යාහ්න 12 ට පෙරාතුව කුවිතාන්සි හා ලියාපදිංචි ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබාගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
**කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.**

කොමුව—3/1—(1/65).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හෝමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 09. 08

9–480—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

### කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 ඔක්තෝබර් මස 12 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා චීන වරායේ ඇති ත්‍රිකුණාමලය සංචිධාන වැඩ පොළට ගඩොල් 1,50,000 ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1973 ඔක්තෝබර් මස 12 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රැජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැත හොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 ඔක්තෝබර් මස 10 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඇම්. බී. දොලපිහිල්ල,
වැඩ බලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1973. 09. 21.

9-474 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ගුවන් හමුදව

1974 ජනවාරි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා (මාස 12) තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා කොළඹ 2, තැ.පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| (i) සැපයීම්/සේවාවන් | (ii) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අවසාන දිනය (දහවල් 12 ට) | (iii) ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කරන දිනය (පෙ.ව. 10 ට) |
|---|---|---|
| (1) කටුනායක පිහිටි ගුවන් හමුද කඳවුරට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම ... | 73.10.15 ... | 73.10.16 |
| (2) කටුනායක පිහිටි ගුවන් හමුද කඳවුරට මස් සැපයීම ... ... ... | 73.10.15 ... | 73.10.16 |
| (3) කටුනායක පිහිටි ගුවන් හමුද කඳවුරට ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... ... | 73.10.15 ... | 73.10.16 |
| (4) කටුනායක පිහිටි ගුවන් හමුද කඳවුරට අලුත්මාළු සැපයීම ... ... ... | 73.10.15 ... | 73.10.16 |
| (5) කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුද කඳවුරුවලට මෙට්ට, කොට්ට සහ කුෂන් නැවත සකස් කිරීම ... ... ... ... .... | 73.10.15 ... | 73.10.16 |
| (6) කොළඹ, කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුද කඳවුරුවලට නිලඇඳුම්, ඇඳඇතිරිලි සහ කූඩාරම් සකස් කිරීම ... ... ... ... ... | 73.10.15 ... | 73.10.16 |
| (7) කොළඹ, කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුද කඳවුරුවලට පාවහන් අලුත්වැඩියා කිරීම ... ... ... ... ... ... | 73.10.16 ... | 73.10.17 |
| (8) කොළඹ, කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුද කඳවුරුවලට ගොඩනැගිලි උපකරණ සැපයීම ... ... ... ... ... ... | 73.10.16 ... | 73.10.17 |
| (9) කොළඹ, චීනවරාය සහ දියතලාව පිහිටි ගුවන් හමුද කඳවුරුවලට නිලඇඳුම් සහ බැරැක්ක රෙදි ඇපිල්ලීම | 73.10.16 ... | 73.10.17 |
| (10) කටුනායක පිහිටි ගුවන් හමුද රෝහලට මාතෘ නිවාස රෙදි ඇපිල්ලීම ... ... | 73.10.16 ... | 73.10.17 |
| (11) කොළඹ සහ කටුනායක පිහිටි ගුවන් හමුද කඳවුරුවලට පලාපු දර සැපයීම ... ... | 73.10.16 ... | 73.10.17 |
| (12) දියතලාව පිහිටි ගුවන් හමුද කඳවුරට පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... ... | 73.10.16 ... | 73.10.17 |
| (13) කොළඹ පිහිටි ගුවන් හමුද කඳවුරට ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... ... | 73.10.16 ... | 73.10.17 |
| (14) රිදියාගම පිහිටි ගුවන් හමුද කඳවුරට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම ... | 73.10.17 ... | 73.10.18 |
| (15) රිදියාගම පිහිටි ගුවන් හමුද කඳවුරට මස් සැපයීම... ... ... ... | 73.10.17 ... | 73.10.18 |
| (16) රිදියාගම පිහිටි ගුවන් හමුද කඳවුරට පාන් සහ උදෑසන ආහාර සැපයීම ... ... | 73.10.17 ... | 73.10.18 |
| (17) රිදියාගම පිහිටි ගුවන් හමුද කඳවුරට අලුත් මාළු සැපයීම ... ... ... | 73.10.17 ... | 73.10.18 |
| (18) රිදියාගම පිහිටි ගුවන් හමුද කඳවුරට නිලඇඳුම් සහ බැරැක්ක රෙදි ඇපිල්ලීම ... ... | 73.10.17 ... | 73.10.18 |
| (19) වීරවිල පිහිටි ගුවන් හමුද කඳවුරට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම ... | 73.10.18 ... | 73.10.19 |
| (20) වීරවිල පිහිටි ගුවන් හමුද කඳවුරට මස් සැපයීම ... ... ... ... | 73.10.18 ... | 73.10.19 |
| (21) වීරවිල පිහිටි ගුවන් හමුද කඳවුරට පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... ... | 73.10.18 ... | 73.10.19 |
| (22) වීරවිල පිහිටි ගුවන් හමුද කඳවුරට අලුත් මාළු සැපයීම ... ... ... | 73.10.18 ... | 73.10.19 |
| (23) වීරවිල පිහිටි ගුවන් හමුද කඳවුරට නිලඇඳුම් සහ බැරැක්ක රෙදි ඇපිල්ලීම ... ... | 73.10.18 ... | 73.10.19 |

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරය සඳහා නැවත ලබාගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙන් (ii) වැනි තීරයෙහි දක්වා ඇති දිනයන්හි දහවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

9-544—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහත දැක්වෙන බඩු මොරටුවේ වෙලෝනා රෙදි ගබඩාවෙන් මිලට ගෙන රැගෙන යාම සඳහා කොළඹ—1, බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩාකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.10.16 වනදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

**මදක් පලුදුවුණු නිම් සරෝම්—11,212ක් පමණ,**

2. ආපසු ගතහැකි තැන්පත් මුදල් වශයෙන් රු. 2,500ක් 1973.10.15 දින දහවල් 12 ට හෝ ඊට පෙර තැන්පත් කර කොළඹ බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂගෙන් ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි හා ආකෘති පත්‍ර ලබාගත හැකිය.

3. වැඩි විස්තර සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු 3/1—(5/47)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
1973 සැප්තැම්බර් මස 08 වැනි දින.

9–479—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

**කුරුණෑගල කැඳ දැමීමේ ආයතනයට වතුර ටැංකියක් ඉදිකිරීම** සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.10.13 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 15,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973.10.12 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/64).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.09.08.

9–478—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

මාතලේ බලවේග පේෂකර්ම ආයතනයට ජල පහසුකම් සැපයීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.10.13 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 6,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකි ය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 50 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973.10.12 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/63).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.09.08.

9–477—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

වත්තේගම බලවේග ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.10.10 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 6,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකි ය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973.10.09 දින මධ්‍යාහ්න 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචි ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ

යොමුව : 3/1—(1/61).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.09.08.

9–475—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

**අම්පිටිය බලවේග ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ** ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.10.10 දින **පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.**

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 5,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකි ය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973.10.09 දින මධ්‍යාහ්න 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචි ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ

යොමුව : 3/1—(1/62).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.09.08.

9–476—73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### පොලිස් දෙපාර්තමේන්තුව

1973 සැප්තැම්බර් මස 29 වැනි දින පෙ. ව. 9.30 ට අනුරාධපුර පොලිස් ස්ථානයේදී පහත සඳහන් ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

2. එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ලබාගන්නා අයවලුන් ඒ සඳහා ගෙවිය යුතු මුදල් එම අවස්ථාවේම මුදලින් ගෙවා නිම කර එම ද්‍රව්‍යයන් ලබාගත් සැනින් ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය.

1. ගුදිරි 17 යි.
2. මදුරු දැල් 1 යි.
3. ගෲන්ඩිග් ඩ්‍රයිබැටරි රේඩියෝ 1 යි. (අංක (1061303381)
4. වෙලිපන්කන් ඩ්‍රයි බැටරි රේඩියෝ 1 යි. (අංක 107484)
5. පාපැදි සීට් 1 යි.
6. පාපැදි සීනු 1 යි.
7. කැරම් බෝඩ් 1 යි.
8. පාපැදි ලාම්පු 1 යි.
9. විදුලි ආලෝක පුවරු 1 යි.
10. රැලේ පාපැදි අංක ඩීඇන් 70274 1 යි.
11. මොනරා පාපැදි අංක ඒඹී 107 1 යි.
12. රැලේ පාපැදි අංක සීකිව් 2203 1 යි.
13. රෝඩ්මාස්ටර් පාපැදි අංක එච්සී 6626 1 යි.
14. රෝඩ්මාස්ටර් පාපැදි අංක ආර්. ඇම්. 8914 1 යි.

එච්. ඇම්. ජී. බී. කොටකදෙනිය.
සහකාර පොලිස් අධිකාරී.
අනුරාධපුර (1).

1973 සැප්තැම්බර් මස 6 වැනි දින,
අනුරාධපුර පොලිස් කාර්යාලයේදීය.

9-506 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පස්යාල, රජයේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පස්යාල රජයේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ ප්‍රයෝජනයට ගතනොහැකි භාණ්ඩ 1973 ඔක්තෝබර් මස 12 දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසිවූ මොහොතේම සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර වෙන්දේසිය පැවැත්වෙන දින ප. ව. 3.30 ට පෙර සියලුම ගැණුම්කරුවන් විසින් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

3. වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලේඛණයක් මෙම කාර්යාලයේ හා එම මධ්‍යස්ථානයේ දැන්වීම් පුවරුවල ප්‍රසිද්ධ කරනු ලැබේ.

4. මෙම භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනට පෙර දිනවලදී කාර්යාල වේලාවන් තුළදී ඉහත සඳහන් මධ්‍යස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

ඒ. පී. ඊ. අබේසූරිය,
පරිපාලන නිලධාරි (ගො.පා.හා.නි).

ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, පළතුරු කම්හල පැර,
නාරාහේන්පිට, කොළඹ 5,
1973.9.7.

9-522 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### වෙන්දේසියේ විකිණීමයි

කොළඹ මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගේ ශාඛාව

පහත සඳහන් භාණ්ඩ 1973 සැප්තැම්බර් මස 28 දින ප්‍රසිඛ වෙන්දේසියේ විකුණනු ලබන අතර වෙන්දේසිය පෙරවරු 9.30 ට ආරම්භ වේ. 1973 සැප්තැම්බර් 25 දින පෙරවරු 9.30 සිට දිවා 12 දක්වා තැපැල් තක්සේරුකරුගේ කායනිලයේදී භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක :—

2. රේගු අයකැමිගේ හෝ ඔහුගේ සහායකයින්ගෙන් කෙනෙකුගේ අනුමැතියට යටත්ව සහ මෙහි මින් මතු සපයා ඇති අවලංගු කිරීමේ අයිතියට යටත්ව, සාමාන්‍යයෙන් වැඩිම ඉල්ලුම්කරු ගැණුම්කරු වේ. ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර ඇති වන කිසියම් මත භේදයක දී වෙන්දේසිය පවත්වන නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

3. හේතු ඉදිරිපත් නොකර ඕනෑම පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයින්ගේ හෝ ලන්සුවක් පිළිගැනීමට ප්‍රතික්ෂෙප කිරීමට වෙන්දේසිය පවත්වන නිලධාරියාට සහ අයකැමිට පුළුවන.

4. ලන්සුවක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ භාණ්ඩ රේගු භූමියෙන් ඉවත් කර ගැනීමට පෙර ඕනෑම වේලාවකදී වෙන්දේසියක් අවලංගු කිරීමේ තනි අයිතිය අයකැමි වෙත තබා ගනී.

5. වෙන්දේසිය අවසානයේදී පිළිගන්නා ලද ලන්සුවේ වටිනාකම සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු භාණ්ඩ භාරදීම කරනු ලැබේ.

6. මිළදී ගන්නා භාණ්ඩවල තත්ත්වය සහ ඒවායේ අඩංගු ප්‍රමාණ සම්බන්ධයෙන් ගැණුම්කරු තමාම සෑහීමකට පත්විය යුතු අතර, එකී භාණ්ඩවල ගුණය, ප්‍රමාණය හෝ තත්ත්වය හෝ භාණ්ඩවල මාතෘකා නාමය පිළිබඳව අයකැමි සහතික නොකරයි. ඉදිරිපත් කර ඇති කොන්දේසි පිළිගෙන ඇත්නම් හැර කිසිම හේතුවක් නිසා ගැනුම් මිල අඩු කිරීමකට ගැණුම්කරුට හිමිකමක් නොලැබේ.

7. භාණ්ඩ පිළිබඳ විස්තරවල ඕනෑම වැරැද්දක් හෝ අත්හැරීමක් වියහැකි අතර, එවැනි වැරදි හෝ අත්හැරීම් හෝ කිසිම විධියකින් අවහිරයක් හෝ වෙන්දේසියට බලපෑමක් නොවිය යුතු මෙන්ම, ඒ වෙනුවෙන් කිසිම වන්දි ගෙවීමක් අනුමත නොකරන අතර, ලන්සු ලියාපදිංචි කිරීමෙන් පසු අනාවරණය වන අඩුවීම පිළිබඳව කිසිම මිල අඩුකිරීමක් නොකරන අතර, සහ ලන්සු තැබීමකට ප්‍රථම හැම කරුණක් පිළිබඳව මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නන් තම තමාම සෑහීමට පත්වී සිටි යයි බලාපොරොත්තු වනු ලැබේ.

8. කොළඹ 1, මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.

රෝලර් චේන්.
පිංතූර තැපැල් පත්.
ගුවන් විදුලි යන්ත්‍ර කොටස්.
ස්පාග් ප්ලග්.
කැසට් ටේප්.
ග්‍රැමපෝන් රැකෝඩ්.
ටින්වල අසුරන ලද ආහාර වර්ග.
බැඩ්මින්ටන් පන්දු නූල්.
"පෙන් පේන්ටින්" පව්ඩර්.
එන්ග්‍රේවින් ටූල්ස්.
ශීතකරන කොටස්.
ශල්‍ය වෛද්‍ය උපකරණ.
හඳුන් කූරු.
ඇස් කන්නාඩි ෆ්‍රේම්.
සුවඳ විලවුන්
ට්‍රැක්ටර් කොටස්.
සෙල්ලම් කාඩ් පැක් යනාදිය.

ඒ. එම්. පී. ජයවර්ධන,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

තැත/73/විකිණීම්/4.
තැපැල් තක්සේරු අංශය,
මහ තැපැල් හල,
කොළඹ.

9-531 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

ආපසු ලැබුණු ලියුම් කායඹාලයට ලැබුණු හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩ වල බහා තිබුණ පහත සඳහන් භාණ්ඩ 1973 ඔක්තෝබර් මස 10 වෙනි බදද උදේ 9.30ට කොළඹ 10, විජේවර්ධන මාවතේ මධ්‍යම ලිපි හුවමාරු කායඹාලයේ අහිමි ලිපි කායඹාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

සාධාරණ මිළකට නොඉල්ලනු ලබන භාණ්ඩ විකිණීම අත්හිටවනු ලැබේ. බඩු මිළයට ගත් අය විසින් වහාම එහි වටිනාකම මුදලෙන් ගෙවා බඩු එදිනම ඉවත් කර ගත යුතුයි.

එච්. ඩබ්ලිව්. ජේ. පෙරේරා,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ වෙනුවට.

තැපැල් කොට්ඨාශය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.
1973 සැප්තැම්බර් 8 වැනි දින.

| භාණ්ඩ අංකය | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| 1 | ... | පරණ පත්තර හොණ්ඩර එකයි |
| 2 | ... | එම |
| 3 | ... | එකක් රාත්තල් 40ක් බර ඇති පරණ මුද්‍රිත කඩදසි මළු 50ක් |
| 4 | ... | ඉංග්‍රීසි සඟරා 100 මිටියක් |
| 5 | ... | එම |
| 6 | ... | එම |
| 7 | ... | එම |
| 8 | ... | එම |
| 9 | ... | එම |
| 10 | ... | එම |
| 11 | ... | එම |
| 12 | ... | විදේශ භාෂා සඟරා 100 මිටියක් |
| 13 | ... | දෙමළ සඟරා 100 මිටියක් |
| 14 | ... | චීන සඟරා 100 මිටියක් (ඉංග්‍රීසි) |
| 15 | ... | වෛද්‍ය සඟරා 50 මිටියක් (ඉංග්‍රීසි) |
| 16 | ... | ඉංජිනේරු සඟරා 50 මිටියක් (ඉංග්‍රීසි) |
| 17 | ... | චීන ළමා පොත් 100 මිටියක් (ඉංග්‍රීසි) |
| 18 | ... | විසිදහසක් පමණ (20,000) පාවිච්චි කළ පරණ මුද්දර තොගයක් |
| 19 | ... | එම |
| 20 | ... | එම |
| 21 | ... | 1973 කැලැන්ඩර් 60 යි |
| 22 | ... | එම |
| 23 | ... | 1973 කැලැන්ඩර් 10යි. |
| 24 | ... | 1973 කැලැන්ඩර් 10 යි |
| 25 | ... | 1973 කැලැන්ඩර් 15 යි |
| 26 | ... | පසුගිය '' රීඩර්ස් ඩයිජෙස්ට් '' සඟරා 25 යි |
| 27 | ... | පසුගිය '' රීඩර්ස් ඩයිජෙස්ට් '' සඟරා 25 යි |
| 28 | ... | පරණ '' රීඩර්ස් ඩයිජෙස්ට් '' සඟරා 25 යි |
| 29 | ... | චීන ප්ලාස්ටික් රෙකෝඩ 200 ක් |
| 30 | ... | එම |
| 31 | ... | එම |
| 32 | ... | එම |
| 33 | ... | චීන ප්ලාස්ටික් රෙකෝඩ 150 ක් සහ ෆයිල් කවර 8 ක් |
| 34 | ... | පසුගිය ජාතික භූගෝල සඟරා 7 ක් (ඉංග්‍රීසි) |
| 35 | ... | 'ලුහුෂන්' විසින් ලියන ලද පොත් 4 ක් (ඉංග්‍රීසි) |
| 36 | ... | චීන පින්තූර කාඩ් පැකට් 40 ක් |
| 37 | ... | පැටන් කැටලොග් පොත් 3 යි, ඉංග්‍රීසි පොත් 3 යි, ආගමික පොත් 2 යි |
| 38 | ... | අළුත් සුදු ෂර්ට් 2 යි. |
| 39 | ... | පාවිච්චි කරන ලද ෂර්ට් 2 යි |
| 40 | ... | සිල්ක් සාරි එකයි (යාර 5 යි) |
| 41 | ... | ස්කට් 1 සැම්පල් රෙදි කෑලි 5 යි |
| 42 | ... | රෙකෝඩ් එකයි (ඉංග්‍රීසි) |
| 43 | ... | පිත්තලෙන් සාදන ලද නයි 2 යි. |
| 44 | ... | සෙල්ලම් බඩු දෙකයි (එකක් පළුදු) 1973 දිනපොත් එකයි, දත් මදින බුරුසු එකයි, පෑන් ටෝච් එකයි (පළුදු) කැසට් ටේප් එකයි, (පාවිච්චි කරන ලද) රිදී පාට මුදු එකයි, කරාබු කූට්ටන් එකයි (පළුදු) |
| 45 | ... | කුළු එකයි, බඳින තැටි දෙකයි |
| 46 | ... | බීඩි කොළ රාත්තල් 3 යි |

9-545—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## මාරවිල මහෙස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ කල්වේලා ඇතිව අයිතිවාසිකම් ඉදිරිපත් කර එම භාණ්ඩ ලබා නොගතහොත් එම භාණ්ඩ 1973 සැප්තැම්බර් මස 28 වැනි දින පෙ.ව. 8.30 ට මාරවිල මහෙස්ත්‍රාත් උසාවි භූමියේදී කුරුණෑගල ප්‍රාදේශිය උසාවි පාලන ලේකම්/අධිකරණ අමාත්‍යාංශයේ නිළධාරියෙකු ඉදිරිපිටදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වමි.

එම භාණ්ඩ, වෙන්දේසි කරනු ලබන දින පෙ.ව. 8.00 ට උසාවි භූමියේදී පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේදී සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් මිළදී ගන්නා ලද භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම නියමිත මුදල් ගෙවා එම භාණ්ඩ වහාම උසාවි භූමියෙන් ඉවත් කළ යුතුය.

පී. එදුස්සූරිය,
හලාවත මහෙස්ත්‍රාත්.

මහෙස්ත්‍රාත් උසාවිය, හලාවත,
1973 ක්වූ අගෝස්තු 30 වැනි දින දීය.

| නඩු අංක | | |
|---|---|---|
| 11037 | ... | අංක ජී.එච්. 71332 දරණ පාපැදි ප්‍රේම් කදයි |
| 12932 | ... | අංක ඩී.ජේ. 138 පාපැදි ප්‍රේම් කදයි, රෝද පාපැදියි |
| 20540 | ... | අංක : ඊ.කිව්. 665 දරණ රලේ පාපැදි එකයි. |
| | | උදලු දෙකයි |
| | | විදුරු ඇසිට් ජාර් |
| | | දිස්පැන්සරි විදුරු බෝතල් |
| | | ඇලුමෙනියම් ලොකු ප්‍රමානයේ සහ කුඩා ප්‍රමානයේ |
| | | ලොකු ටින් බැරල් සහ කුඩා ටින් බැරල් |
| | | ප්ලාස්ටික් ලොකු ප්‍රමාණයේ සහ කුඩා ප්‍රමාණයේ |
| | | ඩ්‍රැම්ස් 8 විදුරු බෝතල් |
| | | කුඩා කැබලිවලට කපන ලද තඹ කම්බි තොගයක් යනාදිය. |

9-534—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැව දඬු හා ආයුධ වෙන්දේසියේ විකිණීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දකුණු දිසා වන නිලධාරි විසින් තවලම අඩවියේ තිබෙන වන අපරාධවලට අයත් (කඳන්, ඉරූ ලී හා ආයුධ වට ලී ඇතුළු) බෝමි, දෙල්, හොර, රුක් අත්තන, දියපර, වැලිපැන්න, උබ්බෙරිය, මිල්ල, හැඩවක, කීන, අලුබෝ, වලුකීන, පෙලන්, කලවම් වටලී ආදී තොග 13 ක් 1973 සැප්තැම්බර් මස 29 වැනි දින පෙරවරු 10.30 ට තවලම අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ දැව හා ආයුධ ඉල්ලුම් කිරීමට අදහස් කරන අයට ඒ ඒ ස්ථාන යන් වෙත ගොස් ඒවා පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

2. වෙන්දේසියේ දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසා වන නිලධාරි කාර්යාලයෙන් හෝ තවලම අඩවි වන නිලධාරි කාර්යාලයෙන් පැමිණ ලබාගත හැක.

ඇම්. පුෂ්පරාජා,
දකුණු දිසා වන නිලධාරි.

1973 අගෝස්තු මස 30 වැනි දින,
ගාල්ලේ, දකුණු දිසා වන නිලධාරි කාර්යාලයේදී ය.

9-546—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

**කැලෑ දෙපාර්තමේන්තුව—වෙන්දේසි දැන්වීමයි**

තොග 8 කින් සමන්විත මිල්ල, කොස්, පෙලන්, ලියන්, හැඩවක, මලබඩ ආදී වර්ගවලට අයත් දැව ඝන අඩි 5874.7 ක් 1973 ඔක්තෝබර් මස 1 වැනි දින පෙරවරු 10.00 ට මවිසින් හැටන් අඩවි වන කායඝිලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියට පෙර එම දැව පරීක්ෂාකර බලන ලෙස අයදුම් කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

3. වැඩි විස්තර මගෙන් හෝ හැටන් අඩවි වන නිලධාරියෙන් ලබාගත හැක.

කේ. පී. ශ්‍රී භාරතී,
උඩරට දිසා වන නිලධාරී.

1973 අගෝස්තු 29 දින,
නුවරඑළියේ,
උඩරට දිසා වන කායඝිලයේ දී ය.

9-547—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසිය**
**බටහිර දිසාව**

තොග 1 කින් යුත් ඉරූ මිල්ල ඝන අඩි 2.1 ක් ද, තොග 15 කින් යුත් ඉරුම්කියත් 3 ක් ද, බත්සිකියත් 6 ක් ද, පොරව 5 ක් ද, උල්පිහියා 2 ක් ද, බෝරකටු 2 ක් ද, මිටි 1 ක් හා කැති 1 කින් සමන්විත දැව හා භාණ්ඩ තොගයක් බස්නාහිර දිසාවේ දිසා වන නිලධාරි විසින් 1973. 9. 28 දින පෙරවරු 9.00 ට මතුගම අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන හවතුන් වෙන්දේසියට පෙර එම දැව සහ භාණ්ඩ බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරීගෙන් හෝ මතුගම අඩවි වන නිලධාරීන්ගෙන් හෝ ලබාගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසාවන නිලධාරී—බටහිර දිසාව.

දිසා වන නිලධාරි කාර්යාලය,
රත්නපුර.

9-548—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**කැලෑ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසියේ විකිණීමයි**

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිසා වන නිලධාරි විසින් කඹුරුපිටිය අඩවියේ තිබෙන වන අපරාධවලට අයත් (ඉරන ලද දැව සහ කදන්) කොස්, වල්ජම්බු, රතපිය, කටුබොඩ යනාදිය සහ ආයුධ තොග 5 ක් 1973 සැප්තැම්බර් මස 28 වැනි දින පෙරවරු 9.30 ට කඹුරුපිටිය අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය ඒ ඒ ස්ථානයන්ට ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

වෙන්දේසියේදී දැව ඉල්ලීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසා වන නිලධාරි කාර්යාලයෙන් හෝ කඹුරුපිටිය අඩවි වන නිලධාරි කාර්යාලයෙන් හෝ පැමිණ ලබාගත හැක.

ඇම්. පුෂ්පරාජා,
දකුණු දිසා වන නිලධාරී.

1973 අගෝස්තු මස 27 වැනි දින,
ගාල්ලේ, දකුණු දිසා වන නිලධාරි කාර්යාලයේදීය.

9-549—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**කැලෑ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසියේ විකිණීමයි**

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිසා වන නිලධාරි විසින් ගාල්ල අඩවියේ තිබෙන වන අපරාධ වලට අයත් (ඉරන ලද දැව සහ කදන්) මැහොගනී, සීන, කිරිහැඹිලිය, ඇටඹ, ආරිද්ද, කිනියා, වැලිපන්න, දියපර, ගොඩපර, හැඩවක, දවට, හවරි නුග, මිල්ල සහ හොර යනාදිය සහ ආයුධ තොග 12 ක් 1973 සැප්තැම්බර් මස 27 වැනි දින පෙරවරු 10 ට ගාල්ලේ අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය ඒ ඒ ස්ථානයන්ට ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

වෙන්දේසියේදී දැව ඉල්ලීමට අදහස් කරනු ලබන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසා වන නිලධාරි කායඝිලයෙන් හෝ ගාලු අඩවි වන නිලධාරි කාර්යාලයෙන් හෝ පැමිණ ලබාගත හැකිය.

ඇම්. පුෂ්පරාජා,
දකුණු දිසා වන නිලධාරී.

1973 අගෝස්තු මස 17 වැනි දින,
ගාල්ලේ, දකුණු දිසා වන නිලධාරි කාර්යාලයේදීය.

9-550—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ වෙලන්ගොඩේ පදිංචි කලුදුර දාසෙන් ද තාබ්‍රෙව් වන මම අද සිට මාසයක් ගතවූ පසු බලපිටිය අධිකරණ කොට්ඨාශය තුල සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්කර ගන්නාමෙන් රෙජිස්ත්‍රාර් ජෙනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරයේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

කේ. ඩී. ද තාබ්‍රෙව්.

1973 සැප්තැම්බර් මස 11 වැනි දින,
වෙලන්ගොඩ,
කොස්ගොඩ.

9-553—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**අනුරාධපුරේ ප්‍රසිද්ධ වෙන්දේසියක්**

අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේදීය

රත්මලේ තුලානේ දිවුල්වැවේ පදිංචි ලියනගේ අමාරිස් පෙරේරා ..................................(පැමිණිලිකරු-නැසීගිය අය).

රත්මලේ තුලානේ දිවුල්වැවේ පදිංචි ලියනගේ කැතරිනාහාමි වෙනුවට පත්කරණ ලද පැමිණිලිකාරී.

නොම්මර 6616 එදිරිව

රත්මලේ පදිංචිව සිට නැසීගිය ඒ. ඇම්. පීටර් සිංඤෝගේ බූදලය භාරකාරී වන පී. ඇම්. සිරිමාවතී..............(විත්තිකාරී).

අනුරාධපුර දිසා අධිකරණයේ අංක 6616 උගස්කර නඩුවේ 1963.6.16 වෙනි දින දී තිබෙන නඩු තීන්දුව යටතේ එම නඩුවේ විත්තිකාරියෙන් රුපියල් දහතුන්දස් හැටහයක් ද (රු. 13,066) 1962.11.23 වෙනි දින සිට 1963.6.16 වෙනි දින දක්වා රුපියල් හත්දාහකට (රු. 7,000) සියේට 10 බැගින් පොලියද එදීනට පසු සම්පූර්ණ මුදල ගෙවා අවසාන වනතුරු සියලුම මුදලට නීත්‍යානුකූල පොලියද, අයකර ගැනීම සඳහා බැඳෙනු නිකුත් කරණ ලද නියම

කරණකොට ගෙන 1973 ඔක්තෝම්බර් මස 27 වෙනි සෙනසුරාදා පෙරවරු 11 ට මෙහි පහත සඳහන් දේපල **පිහිටි ස්ථානයේදී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එනම්.—උතුරු මධ්‍යම දිසාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස්නාහිර නුවරගම් පළාතේ නුවරගම් කෝරළේ රත්මලේ තුලානේ කිරි **මැටියාවේද මහනෙළුබැවේද කුඩානෙලුබැවේද යන ගම්වල පිහිටි** කිරිමැටියාව මූකලාන මහනෙලුබැව කැලේ සහ කුඩා නෙ.ලුබැව කැලේ යන නම් ඇති 1957 අගෝස්තු මස 20 වෙනි දින සී. ජේ. සභාපති බලයලත් මිනින්දෝරු තැන විසින් සාදා දී තිබෙන නොම්මර 1475 දරණ පැලැන් කඩදාසියේ සඳහන් ටී. පී. නොම්මර 01309 යන මූල් සිතියමේ සඳහන් ලොට් නොම්මර 25 දරණ ඉඩමෙන් ලොට් **නොම්මර 3 දරණ ඉඩමට මායිම් :—උතුරට ඉහතකී නොම්මර 1475** දරණ පැලැනේ ලොට් **නොම්මර 2 දරණ ඉඩමද; නැගෙනහිරට:** ලොට් නොම්මර 13 දරණ ඉඩමද; දකුණට: **ඉහතකී නොම්මර** 1475 දරණ පැලැනේ ලොට් **නොම්මර 4 දරණ ඉඩමද; බස්නා** හිරට: **නොම්මර ඇල්. පී. 2489 දරණ බද්ද බල පත්‍රයේ සඳහන්** ඉඩමද යන මායිම තුලු අක්කර 15ක ඉඩම (අක්. 15, රූ. 0, පර්. 0) **අනුරාධපුර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ නොම්මර ඒ 169** කොටසේ 216 වැනි පිටේ ලියාපදිංචි කර ඇත.

**ඔප්පු විමසීම :—**

අනුරාධපුරේ පෙරකදෝරු සහ නොතාරිස්
ඇස්. නඩරාජා මහතාගෙන් විමසන්න.

**ඩී. ජී. විජයවර්ධන,**
**උසාවියේ කොමසාරිස් සහ වෙන්දේසිකරු.**

බසවක්කුලම, අනුරාධපුරය,
1973 අගෝස්තු මස 20 වැනි දින දී ය.

9-560—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.